# 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරන අඩුපාඩු

### (අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අනෙකුත් ආදායම් ශිර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් එකතු කරන ලද ආදායම දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව රු.50,283,070ක් වුවද ආදායම් ප්‍රකාශයේ සහ සැසඳුම් ප්‍රකාශයේ එම අගය රු.50,287,875ක් ලෙස රු.4,805ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ සහ ආදායම් ප්‍රකාශයේ අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කල ආදායම ලෙස රු.50,287,875ක් දක්වා ඇත. | ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීම. |
| (ii) | මූල්‍ය ප්‍රකාශන අනුව වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම (2004-1-00) ආදායම රු.31,965,517ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු.31,960,711ක් වූ බැවින් වෙනස රු.4,806ක් විය. | ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි වැන්දඹු අනත්දරු දායක මුදල (2004.01.00) සටහන් වන්නේ රු. 31,965,517ක් ලෙසය. | ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීම. |
| (iii) | දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ආදායම් සාරාංශ වාර්තාව අනුව ආදායම හා භාණ්ඩාගාර මාසික ආදායම් වාර්තා අනුව ආදායම අතර මාස 7කදී එකතුව රු.13,691ක වෙනසක් නිරීක්ෂණය විය. | ආදායම් ගිණුම් ගත වීමේ ප්‍රමාද දෝෂයක් මත මෙම වෙනස් වීම් ඇති වුවත් වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ආදායම නිවැරදිව ගිණුම් ගත කිරීම. |
| (iv) | ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වීසා බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර හා ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සම්බන්ධ ගාස්තු ආදායම හෙවත් බදු නොවන ආදායමෙන් (2003.02.07) ජනවාරි මාසයේදී ආපසු ගෙවන ලද රු.287,500ක මුදල අනෙකුත් ලැබීම් ආපසු ගෙවීම් (2003.99.00) ලෙස සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ බදු නොවන ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | නිවැරදි ආදායම් ශීර්ෂයෙන් ආපසු ගෙවීම් සිදුකර නොමැත. | ආදායමෙන් ආපසු ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කිරීම. |

### 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂය අවසානයේ ලැබිය යුතු ශේෂය රු.154,640,598ක් වුව ද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු ශේෂය රු.154,170,771ක් වූ බැවින් රු.469,827ක වෙනසක් නිරීක්ෂණය විය. 2019 හා 2020 වර්ෂවලදීද මෙම වෙනස පිළිබඳ විගණකාධිපති විසින් වාර්තා කලද මේ දක්වා නිවැරදි කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයට පෙර සිට පවතින මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | නිවැරදි තොරතුරු ගිණුම් මඟින් ඉදිරිපත් කිරීම. |

### 1.6.3 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ වටිනාකම රු.404,759,071ක් වුවද 2021 ජනවාරි 01 දිනට එම ශේෂය රු.405,030,372ක් ලෙස රු.271,301ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පසුගිය වර්ෂයේ පරිගණක ලේඛනයේ වැරදීමකින් ඇතුලත් වී තිබූ රු.271,301ක් වටිනා පාරිභෝගික භාණ්ඩ, පරිගණක ලේඛනයෙන් ඉවත් කර නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීම සහ හෙළිදරව් කිරීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල තිබූ රු.47,305,154ක නොනිම් වැඩ (ගොඩනැගිලි) ශේෂය 2021 ආරම්භක ශේෂය ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA 6) ඇතුලත් නොකර 2021 වර්ෂයේ ගොඩනැගිලි මිලදී ගැනීම් තීරුවට ඇතුලත් කර තිබුණි. | පරිගණක වැඩසටහනට දත්ත ඇතුළක් කිරීමේදී නොනිම් වැඩ ආරම්භක ශේෂයට ගැලපීම් කල නොහැකි වීම හේතුවෙන් මිලදි ගැනීම් තීරුවට ඇතුලත් කර ඇත. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අග්‍රිම ගිණුම අනුව වියදම් මඟින් අග්‍රිම පියවීමේ වටිනාකම රු.2,113,835,822ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව (SA21) වටිනාකම රු.2,490,631,457ක් වූ බැවින් අග්‍රිම ගිණුමේ රු.376,795,635ක් අඩුවෙන් සටහන් වී තිබුණි. | 2021.12.31 දිනට මුදල් පොතේ ශේෂය රු.376,795,635 කි. ඒම ශේෂය 2021.12.31 දිනට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව ගිණුම් තැබීම. |

### 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 85 (2) (ආ) ප්‍රකාරව පසුව ඇස්තමේන්තු වෙනස් කිරීමට අවශ්‍ය බව පෙනෙයි නම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ඊට හේතු සහිතව ඒ බව ආර්ථික කටයුතු සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කල යුතු වුවද 2021 වර්ෂයේ දී ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර ඇති නමුත්, එසේ වෙනස් කිරීමට අවශ්‍ය හේතු සහිත වාර්තාව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කර නොතිබුණි. | 2021 වර්ෂයේ ඇස්තමේන්තු සංශෝධනය කිරීම, 2022 ඇස්තමේන්තු වාර්තාව මගින් පමණක් ඉදිරිපත් කර ඇත. | ඇස්තමේන්තු සංශෝධනයන් පිළිබඳව නිවැරදිව වාර්තා කිරීම. |
| (ආ) | 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015, 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් තම ත්‍රෛමාසික ආදායම් වාර්තා එම කාලසීමාව අවසන් වූ දින සිට දින 15ක් ඇතුලත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවද ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පැවති කොවිඩ් තත්ත්වය මත ආයතනික කටයුතු අඩාල වීම නිසා වාර්තාව යැවීම ප්‍රමාදවීමක් සිදුවී ඇත. | ආදායම් නිවැරදි පාර්ශවයන් වෙත වාර්තා කිරීම. |

## 2.3 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට වෙන්කල පුනරාවර්තන වැය විෂයයන් 05ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල වසා තැබීම හා වියදම් පාලනය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විසින් ලබාදුන් උපදෙස් මත 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත කාර්යයන් ක්‍රියාත්මක කිරිමට නොහැකි වී ඇත. | අවශ්‍යතා හඳුනාගෙන නිවැරදි හා තාත්ත්වික ඇස්තමේන්තු සකස් කිරීම. |
| (ආ) | ඇස්තමේන්තු සකස් කිරීමේ දී පසුගිය වර්ෂවල වියදම් සම්බන්ධයෙන් විධිමත් අවධානයක් යොමු කර නොතිබුණු බැවින් වෙනත් වියදම් සඳහා 2019 හා 2020 වර්ෂවල වියදම පිළිවෙලින් රු.මිලියන 124.78ක් හා රු.මිලියන 93.57ක් වුවද 2021 වර්ෂයේදී ද රු.මිලියන 223.8ක් වෙන්කර තිබුණි. මෙම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.9ක් මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කල පසුවද රු.මිලියන 120.33ක් හෙවත් සියයට 56ක් ඉතිරිවී තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල වසා තැබීම හා වියදම් පාලනය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විසින් ලබාදුන් උපදෙස් මත 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත කාර්යයන් ක්‍රියාත්මක කිරිමට නොහැකි වී ඇත. | අවශ්‍යතා හඳුනාගෙන නිවැරදි හා තාත්ත්වික ඇස්තමේන්තු සකස් කිරීම. |
| (ඇ) | 2021 වර්ෂයේ දී යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම වෙනුවෙන් වෙන්කල ප්‍රතිපාදනයෙන් සියයට 72ක්ම උපයෝජනය කර නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් සේවා සැපයිම සීමා කිරිම, රාජ්‍ය ආයතනයන් වසා තැබීම සහ නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරිම සිදු වූ බැවින් අපේක්ෂිත පරිදි වියදම් දැරීම සිදු කල නොහැකි විය. | අවශ්‍යතා හඳුනාගෙන නිවැරදි හා තාත්ත්වික ඇස්තමේන්තු සකස් කිරීම.. |
| (ඈ) | 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ මූලධන වැය විෂයන් 4ක් වෙනුවෙන් වෙන්කල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 74 සිට සියයට 99ක් දක්වා 2021 දෙසැම්බර් මාසයේදී වියදම් කර තිබුණි. | 2021 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වයන් තුල නියමිත කාලසීමාවන්හි සැලසුම් කරන ලද කාර්යයන් නිම කිරීමට නොහැකි වූ අතර ඒකී කාර්යයන් 2021 දෙසැම්බර් මස වන විට සම්පූර්ණ කර ඇත. | අවශ්‍යතා හඳුනාගෙන නිවැරදි හා කාලීන ඇස්තමේන්තු සකස් කිරීම. |

**2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් නොවූ එකතුව රු.19,034,888ක බැරකම් 2022 වර්ෂයේදී වවුචර් මඟින් නිරවුල් කර තිබුණි. | 2021 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කරන ලද අවස්ථාව වන විට ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයෙහි මෙම වියදම් බැරකම් ලෙස සටහන්ව නොමැත. | බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කිරීම. |
| (ආ) | වැය විෂයයන් 06ක ඉතිරිය ඉක්මවා රු.10,403,168ක බැරකම්වලට එළඹී තිබුණි. | 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සිදුවූ සුවිශේෂ වැඩසටහන් හේතුවෙන් අනිවාර්යයෙන් සිදු කළ යුතුව තිබූ කාර්යයන් වෙනුවෙන් බැදීම් සඳහා එළඹීමට සිදුව තිබුණි. | ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම/ බැරකම්වලට එළඹීම සිදු නොකල යුතු වීම. |
| (ඇ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 225/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදය සහ 2021 ඔක්තෝම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/02 හි 4.5 ඡේදය ප්‍රකාරව බැදීම් හා බැරකම් සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කල යුතු අතර, එලෙස වාර්තා නොකරන ලද කිසිදු බැදීමක් හෝ බැරකමක් 2022 වර්ෂය තුල නිරවුල් නොකළ යුතු බවත් සඳහන් වුවද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බැදීම් හා බැකම් පිළිබඳ එසේ වාර්තා කර නොතිබුණි. | 2022 වර්ෂය තුල මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | යොමුගත චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීම. |
| (ඈ) | 2021 වර්ෂයේදී වැය විෂයයන් 3ක බැරකම් ලේඛනයේ සඳහන් වටිනාකම හා මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් ප්‍රකාශයේ සඳහන් වටිනාකම අතර රු.428,860ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනයට බැරකම් ඇතුළත් කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද බැරකම් දෙපාර්තමේන්තු බැරකම් ලේඛණයට ඇතුළත් කර ඇති නමුත් එම බැරකම් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් නොවීම මෙම වෙනසට හේතු වී ඇත. | බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කිරීම. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | මු.රෙ.115 (3)(අ) සහ (ආ) ජේද | | පෙර වර්ෂයේ නොවැම්බර් 30ට මත්තෙන් කල යුතු ගෙවීම් වැය සම්මතයෙහි අරමුදල් නොතිබීම හෝ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සතුවූ අපරීක්ෂාකාරී බව හෝ නොසැලකිල්ල හේතු කොටගෙන ගෙවා නොමැති නම් මෙම වර්ෂයේ ගෙවීම් කිරීමට ගණන්දීමේ නිලධාරියා විසින් අනුමත කල ලිපියේ පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වූවත් 2021 වර්ෂයේ දී සිදුකල අදාල ගෙවීම් සම්බන්ධ ලිපි පිටපත් විගණකාධිපති වෙත ලබාදී නොතිබුණි. | මෙම තත්ත්වය වැළැක්වීම සඳහා අභ්‍යන්තර විධිවිධාන සලසා ඇත. | වියදම් පාලනය විධිමත් කිරීම. |
| (ආ) | චක්‍රලේඛ | | | | |
| | (I) 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 07 ඡේදය | 211,232,929 | දෙපාර්තමේන්තුව විසින් මිල දී ගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු හා යාවත්කාලීන කරන ලද ලේඛන ගත තොරතුරු අදාල කාර්තුව අවසානයේ දී කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු වුවද 2021 වර්ෂයේ දී මිලදීගත් ගොඩනැගිලි හා ඉදිකිරීම් රු.54,806,599ක් යන්ත්‍ර හා උපකරණ රු.34,938,734ක් පරිගණක මෘදුකාංග රු.121,150,375ක් හා යන්ත්‍ර හා | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | උපකරණ අපහරණ රු.337,221කට අදාල තොරතුරු ද කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි. | | |
| (II) 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 2021/03 හි 7.7 ඡේදය | 45,190 | දේපල පිරියත හා උපකරණවල අගයට සමාන වටිනාකමක් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ සංචිතයක් ලෙස දැක්විය යුතු වුවත් දේපල පිරියත හා උපකරණවල අගය හා සංචිතයේ අගය අතර වෙනසක් පැවතුණි. | දේපල පිරියත හා උපකරණ සංචිත අගය රු.15,190ක් අඩුවෙන් සටහන් වි ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීම. |

**2.6 අත්තිකාරම් නිකුත් කිරිම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ලබා දීමේ දී අදාළ කාර්යය නිසි ලෙස ඇගයීමට ලක් නොකිරීම හේතුවෙන් 2021 වර්ෂයේ දී සියයට 50ට වැඩි ප්‍රමාණයක් ආපසු මුදලින් පියවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | අත්තිකාරම් නිකුත් කිරිමේදී නිශ්චිතව හදුනාගත් කාර්යයන් සඳහා පමණක්ම අත්තිකාරම් නිකුත් කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර ක්‍රමවේද විධිමත් කර ඇත. | අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීමට අදාල කාර්යයන් විධිමත් කිරීම. |
| (ආ) | 2020 නොවැම්බර් 30 හා 2021 නොවැම්බර් 26 දිනැති පාලක ජනරාල්ගේ අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුකූල නොවන පරිදි 2020 වර්ෂයේදී ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබුණු රු.200,000 ක තැන්පතුවෙන් වර්ෂය අවසන් වන විට පියවා තිබුණේ රු.90,933ක් පමණි. ඉතිරි රු.109,067ක ඉන්ධන බිල්පත් 2021 වර්ෂයේදී පියවා තිබුණු අතර 2020 වර්ෂයේ අවසානයට යථෝක්ත සමාගමට ගෙවිය යුතු බැරකම් වටිනාකම ද මූල්‍ය ප්‍රකාශන අනුව රු.635,298ක් විය. | 2020 වර්ෂයේ ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් එම ආයතනය වෙත ලබා දී තිබු රු.200,000ක මුදලින් වර්ෂය අවසන් වන විට ප්‍රතිපාදන ඉතිරිවී නොතිබු බැවින් පියවීමට හැකි වූයේ රු.90,933ක් පමණි. ඉතිරිය වන රු.109,067ක මුදල 2021 වර්ෂයේදී පියවා ඇත. | අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීමට අදාල කාර්යයන් විධිමත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර 01 සිට වසර 09 දක්වා කාල පරාසයක් තුල වැඩ තහනම් කළ, නිලධාරීන් 05ක ගෙන් අයවිය යුතු එකතුව රු.714,342ක් 2021 දෙසැම්බර් 31 දක්වා අයකරගෙන නොතිබුණි. | ණය මුදල ගෙවන ලෙස ලිපි මඟින් දැනුම් දී ඇති අතර විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | කාර්යක්ෂමව ණයශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කිරීම. |

**2.7** **බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් සඳහා විද්‍යුත් ක්‍රමවේද මඟින් රජයට ගෙවීම් ලබා ගැනීමේ දී ගනුදෙනු සැසඳීම හා පියවීම නිසියාකාරව කල යුතු වුවද ඊට අනුකූල නොවන පරිදි 2013 වර්ෂයේදී අංක UNBIAB මඟින් ලැබුණු ඇමරිකානු ඩොලර් 700ක මුදලක් වර්ෂ 8ක කාලයක් නිශ්කාෂණය නොවූ ලැබීම් ලෙස අංක 71963786 බැංකු ගිණුමේ පැවතුණි. 2020 විගණකාධිපති වාර්තාවේ ද මේ පිළිබඳ වාර්තා කලද 2021 වර්ෂයේ දී ද මෙම වටිනාකම නිරවුල් වී නොතිබුණි. | ඩොලර් මගින් ගණුදෙනු කිරීමේදී ඉතිරි මුදල් ලබා දීම සඳහා මෙම අත්තිකාරම් මුදල අඛණ්ඩව අතුරු අග්‍රිමයක් ලෙස පවත්වා ගෙන යනු ඇත. | බැංකු ගණුදෙනු නිවැරදිව හා විධිමත්ව පවත්වාගෙන යාම. |
| (ආ) | මුදල් රෙගුලාසි 188 (2) ප්‍රකාරව බැංකු ප්‍රකාශ ආශ්‍රයෙන් සිදු කල තැන්පත් හරියාකාරව බැරවී තිබේ දැයි වගකිවයුතු නිලධාරීන් සහතික විය යුතු අතර සැහෙන කාලයක් තුල තැන්පත් බැර වූ බවට බැංකුව විසින් දන්වා නොමැති විට එකී කාරණය සම්බන්ධයෙන් වහාම විමර්ශනය කල යුතු වේ. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දිනට නිශ්කාශනය නොවූ රු.678,464ක තැන්පත් අතර මාස 3ට වැඩි තැන්පතු රු.493,219ක් පැවතුණි. | තැන්පතු පරීක්ෂා කර නිශ්කාෂණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති අතර රු.191,484ක ශේෂය ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | බැංකු ගණුදෙනු නිවැරදිව හා විධිමත්ව පවත්වාගෙන යාම. |
| (ඇ) | අංක 7041443 ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ලැබීම් වටිනාකම රු.990,454ක් වූ අතර ඒ තුල මාස 3 සිට මාස 6 දක්වා වූ හඳුනා නොගත් ලැබීම් වටිනාකම රු.766,475ක් විය. | 2021 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් වටිනාකම රු.377,101කි. බැංකුව මගින් ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීමට ලිපි ඉදිරිපත් කර ඇත. නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | බැංකු ගණුදෙනු නිවැරදිව හා විධිමත්ව පවත්වාගෙන යාම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 12 (ආ) ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද එය ප්‍රධාන ගණන් දීමේ නිළධාරී විසින් අනුමත කර නොතිබුණි.ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් ක්‍රියාකාරකම් සැලැස්ම වාර දෙකකදී සංශෝධනය කර තිබු අතර පළමු හා දෙවැනි වර සංශෝධනය කර සකස් කරන ලද ක්‍රියාකාරකම් සැලැස්ම අනුමත ආකෘතියට අනුකූල නොවීය. | පිළිතුරු ලබා දී නැත. | යොමුගත චක්‍රලේඛයට අනුව සැලැස්ම සකස් කිරීම. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂාවේදී සැලැසුම් කල පරිදි කාර්යයන් ඉටු වී නොතිබුණ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය වු අතර සැලසුම් කරන ලද කාර්යයන් හි මූල්‍ය ප්‍රගතිය, භෞතික ප්‍රගතිය ලෙස ලේඛනගත කර තිබුණු බවද නිරීක්ෂණය විය. | - එම - | සැලසුම් සහ ප්‍රගතිය සම්බන්ධයෙන් නිවැරදි ලේඛන පවත්වාගෙන යාම. |

### 3.2 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුල දී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය විසින් ගමන් බලපත් 286,012ක් නිකුත් කර තිබුණු අතර විවිධ දෝෂ හේතුවෙන් ගමන් බලපත් 2861ක් අවලංගු කර තිබු නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් අනාවරණය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි දත්ත ඇතුලත් කිරීමට කටයුතු කිරීම. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දින වන විට මැද පෙරදිග රටවල් සඳහා වෙනම ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමේ කටයුතු අවසන් කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 වන විටත් මැද පෙරදිග රටවල් සඳහා නිකුත් කරන හිස් ගමන් බලපත්‍ර 4000ක තොගයක් ගබඩාවේ පැවති අතර 2021 සැප්තැම්බර් 30 දින සිට 2022 ජුනි 02 දක්වා නිකුත් කිරීම් හෝ මිලදී ගැනීම් සිදු නොකල බලපත්‍ර වර්ග 4ක් ගබඩාවේ පැවතුණි. | - එම - | තොග පාලනය විධිමත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ද්විත්ව පුරවැසිභාවය නිර්දේශ කිරීම පිළිබඳ කමිටු දීමනා ගෙවීමේදී අංක 237/03, 156/07, හා 29/11 යන වවුචරවල මුදල් ලබාගත් නිලධාරියා විසින්ම අදාල ගෙවීම නිර්දේශ කර තිබුණි. | - එම - | වියදම් කළමනාකරණය විධිමත් කිරීම. |
| (ඇ) | ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ කමිටු සාමාජිකයින්ට ගෙවනු ලබන දිමනාවෙන් සියයට 50ක් කාර්යය මණ්ඩලයට අදියර 03ක් යටතේ ගෙවීම් කිරීම සඳහා පාලක ජනරාල් විසින් අනුමැතිය ලබාදී තිබුණු නමුත් අදාල ගෙවීම් කිරීමේදී ඊට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. | - එම - | අභ්‍යන්තර චක්‍රලේඛ හා නීති රීතිවලට අනුකූල වීම. |

**3.3 ප්‍රසම්පාදනයන්**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව මත්තල ගුවන්තොටුපලේ UPS පද්ධතිය සඳහා බැටරි 160ක් ප්‍රසම්පාදනය සඳහා රු.මිලියන 0.56ක් වෙන්කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය අනුව වියදම් වූ මුදල රු.මිලියන 2ක් ලෙස සටහන් කර තිබුණි. වැය ලෙජරය අනුව මෙම වියදම සහතික කර ගැනීමට ද විගණනයට නොහැකි වී තිබුණි. | 2021 ක්‍රියාකාරි සැලැස්ම යටතේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු.මිලියන 2ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර එමගින් බැටරි මිලදී ගැනීම සඳහා රු.558,335ක් වියදම් කර ඇත. | සැලසුම් සහ ප්‍රගතිය සම්බන්ධයෙන් නිවැරදි ලේඛන පවත්වාගෙන යාම. |
| (ආ) | රත්මලාන ගුවන්තොටුපලේ ආගමන හා විගමන කාර්යාල පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදනය වූ රු.මිලියන1.4ක් සමාලෝචිත වර්ෂයේදී වියදම් කර තිබුණද එහි භෞතික ප්‍රගතිය සියයට 70ක් පමණක් විය. | රත්මලාන ගුවන්තොටුපල කාර්යාල පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන භෞතික ප්‍රගතිය සියයට 70ක් වන අතර එම කාර්යය සඳහා මුදල් ගෙවීමක් කර නැත. වැය ශීර්ෂ තුල ප්‍රතිපාදන මාරු කරමින් වියදම් දැරීම හේතුවෙන් ප්‍රතිපාදන අවසන් වී ඇත. | වියදම් කළමනාකරණය විධිමත් කිරීම. |
| (ඇ) | 2021 වර්ෂයේ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදන කාර්යයන් 2කට වෙන්කල වටිනාකම ඉක්මවා රු.මිලියන 37.7ක වියදම් දරා තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මේ වෙන්කර තිබූ කාර්යයන්හි වෙළඳපල වටිනාකම වෙනස්වීම හා දෙපාර්තමේන්තු අවශ්‍යතාවය සලකා මෘදුකාංග වැඩිදියුණු කිරීම යටතේ සැලසුම්ගත කාර්යයන් සඳහා එම ප්‍රතිපාදන වැයශීර්ෂය තුල මාරුකරමින් වියදම් දරා ඇත. | වියදම් පාලනය විධිමත් කිරීම. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී රු.මිලියන 7.4කට මිලදී ගත් හා එම මිලටම පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබුණු අංක CAE –9358 දරන කාර් රථය 2016 ඔක්තෝම්බර් 15 දින අනතුරකට පත් වී ඇති අතර මෙය අළුත්වැඩියා කර යථාතත්වයට පත්කිරීමේ හැකියාවක් නොමැති බවත් නැවත පාවිච්චි කිරීමට සුදුසු තත්වයේ නොපවතින බවත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ 2019 මාර්තු 08 දිනැති ලිපිය මඟින් තහවුරු වී තිබුණි. තවද 2016 ඔක්තෝම්බර් 27 දිනැති නියෝජිත ආයතනය විසින් නිකුත් කර ඇති ලිපිය අනුව පූර්ණ හානියක් බව තවදුරටත් තහවුරු කර තිබුණි. එසේ වුවද අදාල නිර්දේශ පරිදි මෙම වාහනය සඳහා පූර්ණ හානි වන්දිය ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකිවී තිබුණි. | නීතිපති උපදෙස් අනුව රජයේ ආයතන දෙකක් අතර බැවින් නඩු කටයුත්තකින් තොරව විසඳා ගැනීමට කටයුතු කල යුතු නිසා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා දෙපාර්තමේන්තුවේ එකඟතාවයෙන් අළුත්වැඩියා කිරීම සිදුකර ඇත. | වත්කම් පාලනය විධිමත් කිරීම. |
| (ආ) | යථෝක්ත අනතුරින් පසුව වසර 4කට වැඩි කාලයක් විධිමත් ක්‍රියාමාර්ගයක් නොගෙන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තබා 2021 අප්‍රේල් මස අළුත්වැඩියා සඳහා පෞද්ගලික ආයතනයකට භාරදී තිබුණි. දීර්ඝ කාලයක් වාහනය භාවිතයෙන් තොරව කාර්යාල පරිශ්‍රයේ ගාල් කිරීම තුලින් එහි ආරක්ෂාව හා පැවැත්ම පිළිබඳ ආයතනයේ අවධානය යොමුවී නොතිබුණු බවත් විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය. | අනතුර සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණීමට සැලකිය යුතු කාලයක් ගත වු බැවින් අළුත්වැඩියා කිරීමට ප්‍රමාද වී ඇත. | -එම- |
| (ඇ) | නියෝජිත ආයතනයේ මෙම රථය ගාල් කර තැබීම හේතුවෙන් 2017 වර්ෂයේදී රු.10,000ක් එම ආයතනයට ගෙවීම් කර තිබුණි. | රක්ෂණ මුදල් ලබා ගැනීම පිළිබඳව නිසි එකඟතාවයකට පැමිණීමට නොහැකි වු නිසා වාහනය අදාල පෞද්ගලික ආයතනයේ නවතා තැබීමට සිදුවි ඇත. | -එම- |
| (ඈ) | ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය එනම් මෘදුකාංග හා ආශ්‍රිත දත්ත සහ ප්‍රත්‍යාන්ත පාලන පද්ධතිය,වීසා සැකසීම, ගමන් බලපත්‍ර පද්ධතිය, පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පද්ධතිය යනාදී පද්ධති සඳහා පෞද්ගලික ආයතන 12ක් සමඟ එළඹ තිබු දීර්ඝ කාලීනව පවතින ගිවිසුම් කාලානුරූපීව යාවත් කාලීන කර නොතිබුණි. ගිවිසුම් කාලය අවසන් වී මාස කිහිපයකට පසුව මෙම පෞද්ගලික ආයතන විසින් සකසන ලද ගිවිසුම් හා ආයතනයට සපයන සේවා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන බවට පාලක (තොරතුරු තාක්ෂණ) විසින් ලබාදෙන සහතිකය අනුව ගිවිසුම් යාවත්කාලීන කරනු ලබන අතර | මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතීන් (මෘදුකාංග හා ආශ්‍රිත දත්ත සහ ප්‍රත්‍යාන්ත පාලන පද්ධතිය, විසා සැකසීම, ගමන් බලපත්‍ර පද්ධතිය, පුරවැසි ප්‍රදානය කිරීමේ පද්ධතිය) නඩත්තු කිරීමේ සේවා ගිවිසුම්වලට එළඹීම තොරතුරු තාක්ෂණ අංශයේ හා නීති අංශයේ නිර්දේශ මත සිදු කරනු ලබයි. මෙම සේවා ගිවිසුම් කාලානුරූපීව යාවත්කාලීන කිරීමක අවශ්‍යතාවය ඉහත අංශ වෙතින් යෝජනා කර නොමැති බැවින් ඒසේ ගිවිසුම් යාවත්කාලීන කිරීමක් සිදු කර නොමැත. | ගිවිසුම් යාවත්කාලීනව පවත්වාගෙන යාම. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහල නැංවීමට අවශ්‍ය ඇගයීම් හා සංශෝධනයන් මෙම ගිවිසුමට ඇතුලත් නොවන බවද නිරීක්ෂණය විය. මෙසේ ප්‍රමාද වී අළුත් කරන ලද ගිවිසුම් සඳහා හිඟ මාසයන් හි සේවා ගාස්තු ද එකතු කර එකවර මුදල් ගෙවීම සිදු කර තිබුණි. | තවද, සේවා සැපයුම්කරුවන් විසින් ලබාදෙන සේවාව දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවයට ප්‍රමාණවත් බවට සැහීමට පත්වන බැවින් පාලක (තොරතුරු තාක්ෂණ) විසින් නිර්දේශ කර ඇති බව සලකා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර ඇත. | |
| (ඉ) | භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය වෙනුවෙන් ගිවිසුම්ගත කාලය අවසන් වුවද 2022 මැයි මාසය අවසානය දක්වා ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණු අවස්ථා 3ක් පැවතුණි. | මෙම ආයතන 03 හි නඩත්තු සේවා ගිවිසුම් යාවත්කාලීන කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය වෙත ඉදිරිපත් කර නොමැත. | වත්කම් පාලනය විධිමත් කිරීම. |

**4. යහපාලනය**

----------------

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය, වීසා සැකසීම, ගමන් බලපත්‍ර පද්ධතිය හා පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පද්ධතිය යනාදී පද්ධතිවල මිලදී ගැනිම් හා සේවාවන් සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතන 7 ක් සමඟ දෙපාර්තමේන්තුව විසින් ගිවිසුම් ගතවී තිබුණු අතර 2021 හා 2020 වර්ෂයන්හිදී එම ආයතන වෙත පිළිවෙලින් රු.මිලියන 145.7ක් හා රු.මිලියන 142ක් නඩත්තු හා සේවා සඳහා ගෙවීම් කලද එම පද්ධතිය වරින්වර ක්‍රියා විරහිතවීම හා පද්ධතිය අඩපණවීම සිදුවන අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය කාර්යක්ෂමව සිදුකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම වීසා කාලය ඉක්ම වීම හේතුවෙන් නිත්‍යානුකූල නොවන ලෙස රට තුල රැඳිසිටින්නන්ගේ මුළු සංඛ්‍යාව හඳුනා ගැනීමට හා විදේශ ධූත මණ්ඩල අංශයෙන් නිකුත් කරන ගමන් බලපත්‍ර වල ආදායම වෙනම හඳුනා ගැනීමට නොහැකි වීමද විගණන නිරීක්ෂණය විය. | දෝෂය හඳුනාගෙන එය නිරාකරණය සඳහා නව පද්ධතිය හඳුන්වාදීම සහ එය ගොඩනැගීම 2021 වර්ෂයේ ආරම්භ කරන ලදී. එම පද්ධතිය මේ වනවිට පරීක්ෂණ අදියරේ පවතින අතර 2022 මැයි මස අගභාගයේ සිට විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව මත ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසා ඇත. | පද්ධති වඩාත් ඵලදායීව පවත්වාගෙන යාම. |
| (ආ) | 2021 වර්ෂය තුලදී අයදුම්පත්‍ර 409,464ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර එයින් බලපත්‍ර 382,532ක් එනම් සියයට 93ක් 2021 වර්ෂයේදී නිකුත් කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | කාර්යයසාධනය උපරිම මට්ටමින් පවත්වාගෙන යාම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විදේශ දූත මණ්ඩල මගින් ලබාගන්නා ගමන් බලපත්‍ර සඳහා එහි පරිපාලන වියදම් ලෙස ඩොලර් 100ක් අයදුම්කරුගෙන් අයකර ගනු ලැබුවද අයදුම්පත්‍රය සමඟ අවශ්‍ය ලිපිලේඛන නිවැරදිව හා සම්පූර්ණව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සේවාලාභියා වෙත කාර්යක්ෂම සේවාවක් ලබාදීමට නොහැකි වීම තුලින් අදාල සේවාව සඳහා මුදල් ගෙවා අවසන් වුවද ගමන් බලපත්‍රය ලබාගැනීමට අයදුම්කරුට දිර්ඝ කාලයක් ගතවී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | විදේශ දූත මණ්ඩල මගින් ගමන් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම. |
| (ඈ) | 2021 වර්ෂයේදි විදේශ දූත මණ්ඩල ශාඛාව වෙත අයදුම්පත්‍ර 64,280ක් ලැබී තිබුණු අතර ගමන් බලපත්‍ර 61,833ක් සකස්කර තිබුණි. එසේම විවිධ දෝෂ හේතුවෙන් 2021 වර්ෂයේදි ගමන් බලපත්‍ර 667ක් අවලංගු කර තිබුණි. | - එම - | විදේශ දූත මණ්ඩල මගින් ගමන් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 1292ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 1016ක් වූ බැවින් පුරප්පාඩු හා අතිරික්ත කාර්යමණ්ඩලය පිළිවෙළින් 278ක් හා 02ක් විය. | අනුමත හා තත්‍ය කාර්යමණ්ඩලය පිළිගෙන ඇත. | මානව සම්පත් කළමණාකරණය විධිමත් කිරීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුරක් වූ ආගමන හා විගමන පාලක (විමර්ශන හා මෙහෙයුම්) තනතුර වර්ෂ ගණනාවක සිට හිස්ව පවතින අතර 2021 වර්ෂයේදී ද පියවීමට කටයුතු කර නොතිබුණි. | මෙම තනතුරට අදාලව බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | මානව සම්පත් කළමණාකරණය විධිමත් කිරීම. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ අනුමත සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව 20ක් වුවද 2020 වර්ෂයේ සිට විගණන වාර්තාවේ දින දක්වා අතිරික්ත නිලධාරීන් දෙදෙනෙකු සේවය ලබා ගෙන තිබුණි. | එක් නිලධාරියෙකු වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇති අතර අනෙක් නිලධාරියා ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු වීම් ලබා ඇති බැවින් මුදා හැරීමට නියමිතව ඇත. | - එම - |